**ශීර්ෂය 287- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016**

---

ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 14 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1. විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 423.01 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 416.24 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 6.77 ක් හෙවත් සියයට 1.60 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 385.61 | 379.50 | 6.11 | 1.58 |
| මූලධන | 37.40 | 36.74 | 0.66 | 1.76 |
| **එකතුව** | **423.01** | **416.24** | **6.77** | **1.60** |

## 2.2. අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 16.00 | 15.92 | 11.00 | 14.38 | 65.00 | 42.89 |

## 2.3. පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ තැන්පත් ගිණුම් 2 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 0.54 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0013/0087/000 | 0.29 |
| 6000/0000/00/0016/0080/000 | 0.25 |
| **එකතුව** | **0.54** |

## 2.4. විගණන නිරීක්ෂණය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1. විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 64 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 3.2. රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිලිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 28701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,080,684 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 3.3. අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 3.4. වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබූ අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

ඉඩම් අමාත්‍යාංශය සතුව තිබුණු වාහන 07 ක් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 8 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට භාවිතයට ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.5 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කීපයක් පහත දැක්වේ.

(i) හිමිකම් ලියාපදිංචි ක්‍රියාවලියේ පසෙක තැබූ ගොනු පිළිදව කටයුතු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- හිමිකම් ලියාපදිංචි ක්‍රියාවලියේදී පැන නගින විවිධ ගැටළු හේතුවෙන් ක්‍රියාවලියේ විවිධ පියවරයන්හිදී මැනුම් කරන ඉඩම් කැබලිවලට අදාළ ලිපිගොනු තාවකාලිකව පසෙක තැබීමක් සිදු කර තිබුණි. 2016 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා ඉඩම් කැබලි 22,485 කට අදාළ ලිපිගොනු ප්‍රමාණයක් පසෙක තබා තිබුණු අතර පූර්ව වර්ෂවලදී පසෙක තබන ලද ලිපිගොනුද ඇතුළුව ලිපිගොනු 8331 ක් සඳහා පමණක් විසඳුම් ලබාදී හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහනට එක් කර තිබුණි.
- පසෙක තබන ලද ඉඩම් කැබලි සම්බන්ධයෙන් විධිමත් ලෙස වාර්ෂිකව තොරතුරු රැස් කිරීමක් 2015 වර්ෂය දක්වා සිදු කර නොතිබුණු අතර 2015 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාලවලින් විමසා පූර්ව වර්ෂ 09 කට අදාළ පැරණි ලිපිගොනු පිළිබඳ තොරතුරු රැස්කර උපලේඛනයක් සකස් කර තිබුණි. එසේ ලබා ගත් තොරතුරුවලට අනුව 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විවිධ ගැටළු හේතුවෙන් පසෙක තබන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 344,175 ක් වී තිබුණි.

(ii) බිම් සවිය වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2007 වර්ෂයේ සිට දේශීය අරමුදලින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ බිම් සවිය වැඩසටහන වර්ෂ 15 කින් එනම් 2021 වර්ෂයේදී අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද 2016 වර්ෂය වන විට වර්ෂ 10 ක කාලයක් ගත වී තිබුණත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වන වගන්තිය යටතේ දැන්වීම් ප්‍රසිද්ධ කර මිනුම් කටයුතු ග්‍රාම නිලධාරි කොට්ඨාශ 3512 කින් 981 ක හෙවත් සියයට 28 ක පමණක් අවසන් කර තිබුණි.

- බිම්සවිය වැඩසටහන ප්‍රාදේශීය කාර්යාල හරහා ක්‍රියාත්මක කරන අතර ප්‍රාදේශීය කාර්යාලවල ගොඩනැගිලි කුලී, ඉන්ධන හා වාහන නඩත්තු වියදම් සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේදී රු.27,936,868 ක් වැය කර තිබුණි. එය බිම්සවිය ව්‍යාපෘතිය සඳහා වූ වියදමෙන් සියයට 31 ක් වී තිබුණි. ප්‍රාදේශීය කාර්යාලවල පිළිබඳව සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී ඒවායේ කාර්යසාධනය පහළ මට්ටමක පැවතුණි.

**(ආ) සැලැසුම් කිරීම**

**----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු**

**----------------------------------------**

ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේදී 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් පහත පරිදි අඩු කර තිබුණි.

| කාර්යය | ඉලක්කයන්ගේ අඩුවීම (ඉඩම් කැබලි) | ප්‍රතිශතය |
|---|---|---|
| ---------- | ------------------- | ---------- |
| ක්ෂේත්‍ර විමර්ශන සංඛ්‍යාව | 44,930 | 22 |
| ඉඩම් ලියාපදිංචි පරීක්ෂණ සංඛ්‍යාව | 30,000 | 22 |
| නිර්දේශ කර අනුමත කළ සංඛ්‍යාව | 37,810 | 30 |
| තීරණ ප්‍රසිද්ධ කළ සංඛ්‍යාව | 40,000 | 32 |
| ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවා ඇති සංඛ්‍යාව | 54,000 | 44 |

2015 වර්ෂයට සාපේක්ෂව සලකා බැලීමේදී 2016 වර්ෂයේදී සැලසුම්ගත ඉලක්කයන් අඩුකර තිබුණු නමුත්, එම ඉලක්කයන්ද ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) 2016 වර්ෂයේ බිම්සවිය වැඩසටහනේ වාර්ෂික ප්‍රගතිය පහත පරිදි විය.

| කාර්යය | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය (ඉඩම් කැබලි සංඛ්‍යාව) | 2016.10.06 දින සංශෝධිත ඉලක්කය | ප්‍රගතිය (ඉඩම් කැබලි සංඛ්‍යාව) | ඉලක්කයට අනුව ප්‍රගතියේ ප්‍රතිශතය | සංශෝධිත සැලැස්ම අනුව කාර්යයන් ඉටුකිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| --------- | ------------- | ------------ | ----------- | ----------- | ------------- |
| ක්ෂේත්‍ර විමර්ශන සංඛ්‍යාව | 160,000 | 87,000 | 124,848 | 78.03 | 143.50 |
| ඉඩම් ලියාපදිංචි පරීක්ෂණ සංඛ්‍යාව | 105,000 | 57,000 | 51,106 | 48.67 | 89.66 |
| නිර්දේශ කර අනුමත කළ සංඛ්‍යාව | 88,000 | 48,000 | 60,830 | 69.13 | 126.73 |
| තීරණ ප්‍රසිද්ධ කළ සංඛ්‍යාව | 85,000 | 47,000 | 59,880 | 70.45 | 127.40 |
| ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවා ඇති සංඛ්‍යාව | 70,000 | 38,000 | 36,256 | 51.79 | 95.41 |

2015 වර්ෂයට සාපේක්ෂව ඉලක්කයන් අඩුකර තිබියදීත් ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. ඉලක්කයන් හා සැසඳීමේදී ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවා තිබුණු ඉඩම් කැබලි සංඛ්‍යාව සියයට 52 ක් වූ අතර පූර්ව වර්ෂයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව වූ 53,584 හා සැසඳීමේදී සියයට 32 ක අඩුවීමක් සිදු වී තිබුණි.

(iii) 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම 2015 නොවැම්බර් 01 දින අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණු අතර එම ඉලක්කයන් සියයට 46 කින් අඩු කරමින් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් 2016 ඔක්තෝබර් 06 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. මෙහි සංශෝධන සිදු කරන ලද දිනට පූර්ව සිදු කරන ලද කාර්යයන්ට අදාළ ඉලක්කයන්ද සංශෝධනය කර තිබුණි.

## 3.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක විස්තර පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව සතු වාහනයක් රු.232,000 ක ඇස්තමේන්තුවක් මත, අවම ලංසුව ඉදිරිපත් කර තිබූ පෞද්ගලික ගරාජයක් වෙත අළුත්වැඩියාව සඳහා භාර දී තිබුණි. අළුත්වැඩියාව අවසන් වන විට මුළු වියදම රු.398,977 ක් දක්වා රු.166,077 කින් වැඩි වී තිබුණු අතර එය අනෙක් සැපයුම්කරුවන් දෙදෙනාගේ ඉදිරිපත් කර තිබුණු ලංසු වටිනාකම් ඉක්මවා යාමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුව සතු වාහනයක් අළුත්වැඩියාව සඳහා ලියාපදිංචි ගරාජයක් වෙත රු.369,341 ක අළුත්වැඩියා කිරීමේ ගාස්තුවක් මත භාර දී තිබුණි. එම රථයේ මයිලෝමීටරය ක්‍රියාවිරහිතව පැවති අතර ගරාජයට භාර දෙන විට එහි අංකය කි.මී. 129,919 ක්ව පැවති අතර ආපසු රථය දෙපාර්තමේන්තුව වෙත භාරදෙන විට කි.මී 129,008 ක් දක්වා කි.මී.911 කින් අඩු වී තිබුණි.

## 3.7. අනාර්ථික ගනුදෙනු

හෝමාගම ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන ගිය ගොඩනැගිල්ලෙහි අඩුපාඩු සහිත බැවින් වෙනත් ස්ථානයකට ගෙනයාම හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා ලංසු කැඳවීමකින් තොරව එම කාර්යාලය හෝමාගම දුම්රියපල පාරේ පිහිටි වර්ග අඩි 5000 කින් යුත් ගොඩනැගිල්ලක පළමු මහල වෙත රැගෙනයාම සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නව ගොඩනැගිල්ලේ පළමු මහලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් නොවීම හේතුවෙන් එහි වර්ග අඩි 4000 කින් යුතු බිම් මහලෙහි කාර්යාලය ස්ථාපිත කර තිබුණි. රජයේ තක්සේරුව අනුව එහි මාසික කුලිය රු.70,000 ක් වී තිබුණි. මේ අනුව 2014 අගෝස්තු 01 දින සිට 2015 ජනවාරි 31 දින දක්වා මාස 06 ක කාලයක් වෙනුවෙන් බදු ගිවිසුමකට එළඹ තිබුණු අතර, 2015 ජනවාරි 26 දින වන විටත් ඉදිකිරීම් සම්පූර්ණ නොවීම මත 2015 ජූලි 31 දක්වා පෙර තක්සේරුව මතම බදු ගිවිසුමකට එළඹ තිබුණි.

(ආ) කාර්යාලය සඳහා භාවිතා කරන බිම් ප්‍රමාණය වර්ග අඩි 2860 ක් වුවද, වර්ග අඩි 4000 ක ගොඩනැගිල්ලම තක්සේරු කරවා ගෙන රු.70,000 ක මාසික බදු කුලියක් වර්ෂයක් පුරා ගෙවා තිබීමෙන් භාවිතා නොකරන ලද භූමි ප්‍රමාණයක් වෙනුවෙන්ද ගෙවීම් කර තිබුණි. එසේම 2015 මැයි මාසය දක්වා වූ මාස 10 ක කාලයක් තුළදී මහල් 03 ටම අදාළ විදුලි ගාස්තුවද දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

(ඇ) කාර්යාලය සඳහා අනුමැතිය ලබා දී තිබූ පළමු මහලට පිවිසීම වසරක ප්‍රමාදයකින් පසු සිදු කර තිබුණු අතර රු. 65,000 ක මාසික කුලිය මත 2016 ජූලි 31 දක්වා වසරක කාලයකට බදු ගිවිසුමකට එළඹ තිබුණි.

(ඈ) මෙම ගොඩනැගිල්ලේ බදු තක්සේරුව වූ රු.65,000 ක් 2015 ජුනි 15 දින සිට වර්ෂ 02 කට වලංගු වන නමුත්, කොන්ත්‍රාත්කරු විසින් දෙවන අවුරුද්ද සඳහා මාසික කුලිය රු.85,000 දක්වා වැඩි කරන ලෙස ඉල්ලීම සහ සහකාර කොමසාරිස් (හෝමාගම) විසින් සාධාරණීකරණය කිරීම මත නැවතත් රජයේ තක්සේරුව ලබාගෙන තිබුණු අතර එහිදී 2017 වර්ෂය සඳහා මාසික කුලිය රු.70,000 ක් ලෙසට තක්සේරු කර තිබුණි.

## 3.8. කළමනාකරණ දුර්වලතා

කුරුවිට ප්‍රාදේශීය කාර්යාලයට අයත් වාහනයක් රු.866,651 ක ඇස්තමේන්තුවක් මත අළුත්වැඩියාව සඳහා පෞද්ගලික ආයතනයක් වෙත භාර දී තිබුණි. දින 45 ක කාලයකින් අළුත්වැඩියාව සම්පූර්ණ කළ යුතුව තිබුණත්, ඒ සඳහා මාස 11 කට ආසන්න කාලයක් ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 107 | 46 | 61 |
| (ii) | තෘතීයික මට්ටම | 06 | 05 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 1747 | 620 | 1127 |
| (iv) | ප්‍රාමික මට්ටම | 254 | 146 | 108 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 126 | - | 126 |
| | **එකතුව** | **2,240** | **817** | **1,423** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරී තනතුර 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර තනතුරු 186 ක් ප්‍රාදේශීය කාර්යාල 90 ක් වෙනුවෙන් අනුමත කර තිබුණු නමුත්, 2017 ජුනි 14 ක් දින ආරම්භ කර ඇති කාර්යාල 46 ක් සඳහා ද තථ්‍ය කාර්ය මණ්ඩලයෙහි 06 දෙනෙක් පමණක් සිටින බව නිරීක්ෂණය විය.

(ඇ) ලේඛන සංරක්ෂක තනතුරු 91 ක් අනුමත කර තිබුණ ද, තථ්‍ය කාර්ය මණ්ඩලයේ එක් අයෙකු පමණක් සිටින අතර, කාර්යාල කාර්ය සහායක 126 ක් කොන්ත්‍රාත් පදනමින් අනුමත කර තිබුණද ඒ සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ඈ) බිම් සවිය වැඩසටහන තුළ විශාල කාර්යභාරයක් පැවරී ඇති, නියෝජ්‍ය හා සහකාර කොමසාරිස් නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව 80 ක් වන අතර, සහකාර හිමිකම් විමර්ශන නිලධාරී සහ සංවර්ධන නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 421 ක් හා 275 ක් විය. මේ අනුව විශාල වියදම් කර උප කාර්යාල පවත්වාගෙන ගියද, කාර්යසාධනය අඩුවීම කෙරෙහි සේවක පුරප්පාඩු හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.